කුලියාපිටිය නගර සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
--------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 08 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 07 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සිනමා ශාලාවල විනෝද බදු මුදලින් සියයට 50 ක ප්‍රතිශතයක් පමණක් ගිණුම්ගත කිරීම ප්‍රතිපත්තිය වී තිබුණි.

(ආ) ජංගම නොවන වත්කම් ගිණුම්වල හඳුනාගැනීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.213,500 ක උසාවි දඩ මුදල් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) තොග අගය කිරීම ගත් මිලට සිදු කිරීම ගිණුම් ප්‍රතිපත්තිය වුවද, 2015 දෙසැම්බර් 31 දිනට භෞතික තොග ශේෂය අගය නොකර රු.23,815,788 ක් වූ ලෙජර ගිණුමේ ශේෂය ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය අවසානයට රු.18,597,358 කින් භෞතික තොග ශේෂයට වැඩියෙන් ලෙජර ගිණුම් ශේෂය දක්වා තිබුණද එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසාන කාර්තුව සඳහා පල්ලපිටිය ආදාහනාගාර සේවා ගාස්තු ආදායම වූ රු.456,000 ක මුදල ආදායම් ලෙස හඳුනා නොගෙන ආපසු ගෙවිය යුතු තැන්පතු යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ අවසාන කාර්තුව සඳහා පල්ලපිටිය ආදාහනාගාරයේ ලාභයෙන් සියයට 50 ක මුදල වූ රු.124,198 ක් කුලියාපිටිය ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු වුවද, එම වටිනාකම ණයහිමි යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) 2015 වර්ෂයේදී 2016 වර්ෂය සඳහා ලද වරිපනම් බදු රු.190,910 ක් වගකීම් යටතේ ගිණුම්ගත නොකර 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම් බදු ශේෂයෙන් අඩුකර ගිණුම්ගත කර තිබුණි.

(උ) වරිපනම් අයකිරීම් හා අදාල වරෙන්තු ගාස්තු ආදායම් ශේෂය වරෙන්තු ගාස්තු හා දඩ යටතේ ගිණුම්ගත නොකර වරිපනම් හා බදු ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

සමාලෝචිත වර්ෂය අවසානයේ ගිණුම් විෂයයන් 03 කට අදාලව පැවති ශේෂයන් හා ඒවාට අදාල අනුරූපී ලේඛණවල පැවති ශේෂයන් අතර රු.9,575,024 ක නොසැසඳීම් අනාවරණය වුණි.

### 1.3.4 ලැබිය යුතු ගිණුම්

--------------------

2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.19,266,727 ක් වූ අතර ඉන් රු.15,924,811 කට අදාල කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් කළද, රු.3,341,916 ක ශේෂයන්ට අදාල කාල විශ්ලේෂණ ඉදිරිපත් නොවීම තවද වසර 03 ක් ඉක්මවා තිබුණු ලැබිය යුතු ශේෂවල වටිනාකම රු.2,232,160 ක් වූ අතර ඒවා අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 1.3.5 ගෙවිය යුතු ගිණුම්

---------------------

2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.35,044,117 ක් වූ අතර ඉන් රු.24,595,784 කට අදාල කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් වුවද, රු.10,448,334 කට අදාල කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් නොවුණි. කාල විශ්ලේෂණය ඉදිරිපත් කළ ශේෂවලින් වසර 03 ක් ඉක්මවා තිබුණ රු.9,930,567 ක ශේෂ නිරවුල් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.

## 02. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.23,770,479 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.14,886,643 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,883,836 ක වර්ධනයක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.6,275,496 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.25,970,471 ක් වූ ප්‍රාග්ධන වියදම ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.4,075,504 ක අතිරික්තයක් බවට පත්වී තිබුණි.

## 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල තථ්‍ය ආදායම, වියදම අදාල විචලනයන් සමඟ පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ආදායම | | | වියදම් විෂයය | වියදම | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | 2015 | 2104 | විචලනය | | 2015 | 2014 | විචලනය |
| | | රු. | රු. | රු. | | රු. | රු. | රු. |
| (i) | උත්පාදිත ආදායම | 60,165 | 53,443 | 6,722 | පෞද්ගලික පඩිනඩි | 73,782 | 55,834 | 17,948 |
| (ii) | වෙනත් | 60,805 | 49,086 | 11,719 | අනෙකුත් උප | 23,418 | 31,808 | (8,390) |
| | උප එකතුව | 120,970 | 102,529 | 18,441 | එකතුව | 97,200 | 87,642 | 9,558 |
| (iii) | ප්‍රාග්ධන ආදායම | 6,276 | 2,268 | 4,008 | ප්‍රාග්ධන | 25,971 | 18,256 | 7,715 |
| | මුළු එකතුව | 127,246 | 104,797 | 22,449 | වියදම මුළු එකතුව | 123,171 | 105,898 | 17,273 |
| | මෙහෙයුම් ප්‍රතිඵලය | 23,770 | 14,887 | 8,883 | අතිරික්තය/ ඌනතාවය | 4,075 | (1,101) | 5,176 |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්ථන ආදායම වූ රු.120,969,779 න් සියයට 50 ක් හෙවත් රු.60,804,636 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.6,275,496 ක මුළු ප්‍රමාණයම වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලබාදී ඇති මුදල් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්ථන වියදම වූ රු.97,199,300 න් සියයට 76 ක් හෙවත් රු.73,781,563 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් සියයට 71 ක් හෙවත් රු.52,284,221 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් ලබාදී තිබුණු අතර එම වටිනාකම ආදායම් ආධාර යටතේ ගිණුම්ගත කර තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තු ගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම පහත පරිදි විය.

| | ආදායම් විෂයය | 2015 ඇස්තමේන්තුගත | 2015 තථ්‍ය | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2014 ඇස්තමේන්තුගත | 2014 තථ්‍ය | 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 14,044 | 16,468 | 9,601 | 15,791 | 11,803 | 10,477 |
| (ii) | බදු කුලී | 11,897 | 12,824 | 1,011 | 10,981 | 12,261 | 231 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 15,079 | 13,104 | - | 13,541 | 13,553 | - |
| (iv) | වෙනත් ආදායම් | 64,502 | 78,574 | 8,569 | 62,215 | 55,729 | 14,160 |
| | එකතුව | 105,522 | 120,970 | 19,181 | 102,528 | 93,346 | 24,868 |

### 2.3.2 බිල්කල ආදායම හා හිඟහිටි ආදායම්

විස්තර පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015/01/01 දිනට හිඟය | වර්ෂයේ බිල් කිරීම් | එකතුව | ආදායම් රැස් කිරීම: 2015/01/01 දක්වා හිඟයෙන් | ආදායම් රැස් කිරීම: බිල්කල ආදායමින් | ආදායම් රැස් කිරීම: එකතුව | හිඟහිටි ශේෂය: 2015/01/01 දිනට පැවති හිඟයෙන් | හිඟහිටි ශේෂය: බිල්කළ ආදායමින් | හිඟහිටි ශේෂය: 2015/01/01 දිනට හිඟ ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 10,477 | 16,468 | 26,945 | 6,370 | 10,974 | 17,344 | 4,107 | 5,494 | 9,601 |
| බදු කුලී | 231 | 8,463 | 8,694 | 231 | 7,452 | 7,683 | - | 1,011 | 1,011 |
| බලපත්‍ර ගාස්තු | - | 13,104 | 13,104 | - | 13,104 | 13,104 | - | - | - |
| වෙනත් ආදායම් | 14,160 | 78,574 | 92,734 | - | - | 67,714 | - | - | 25,020 |
| එකතුව | 24,868 | 116,609 | 141,477 | 6,601 | 31,530 | 105,845 | 4,107 | 6,505 | 35,632 |

**2.3.3 වරිපනම් බදු**

-------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගැමා වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ කඩ කාමර අංක 36 සිට 63 දක්වාද, පළමු මහලේ අංක 01 සිට 66 දක්වාද අනුකූලතා සහතික ලබා ගැනීමට ඉල්ලුම් කිරීම අනුව 2014 සැප්තැම්බර් 27 දින කඩ කාමර අංක 36 සිට 56 දක්වාත්, 61 සිට 63 දක්වාත් අනුකූලතා සහතික නිකුත් කර තිබුණද, 2016 ජූනි දක්වා තක්සේරු වටිනාකම් ලබාගෙන වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 කට වැඩි හා වර්ෂ 03 ට අඩු රු.4,908,463 ක්ද, වර්ෂ 03 ට වැඩි වර්ෂ 04 ට අඩු රු.1,460,917 ක් ද, වර්ෂ 05 ට වැඩි රු.962,152 ක් ලෙස හිඟ වරිපනම් බදු ශේෂ පැවතියද 2016 මාර්තු 31 දිනය වන විට හිඟයෙන් අයකර තිබුනේ රු.3,794,038 ක ශේෂයක් පමණි.

**2.3.4 බදු කුලී**

---------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 1983 වර්ෂයේ සිට සාප්පු සංකීර්ණයේ කඩ කාමර 54 ක් දීර්ඝ කාලීන බදු පදනම මත ලබා දී තිබුණි. 1983 වර්ෂයේ සිදු කරන ලද පළමු තක්සේරුවෙන් පසුව කිසිදු තක්සේරුවක් සිදු කර නොතිබුණු හෙයින් 2015 පෙබරවාරි 25 දින නව තක්සේරුවක් ලබාගෙන ගාස්තු අය කිරීම් කටයුතු කර තිබුණි. පෙර පැවති ගාස්තු හා සැසඳීමේදී නව තක්සේරුව විශාල මුදලක් වූ බැවින් නව තක්සේරුව මත කුලී මුදල් ගෙවීම බදු කරුවන් විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දිනට රු.768,758 ක හිඟයක් පැවතුණි.

(ආ) බස් නැවතුම්පල පළමු මහලේ අංක 117/28/1/1 හා 117/27/1/3 යන කඩ කාමර සහ බිම් මහලේ දැල් ආවරණ සහිත භූමිය මගී ප්‍රවාහන අධිකාරියට ගාස්තු අය කිරීමකින් තොරව ලබා දී තිබුණු අතර 2013 ඔක්තෝබර් 29 දින සභා තීරණයක් මගින් 117/28/1/1 කඩ කාමරයෙන් රු.4,000 ක්ද, 117/28/1/3 කඩ කාමරයෙන් රු.2,000 ක්ද අය කර ගැනීමට තීරණය කර තිබුණි. කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි.

**2.3.5 බලපත්‍ර ගාස්තු**

----------------

සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ප්‍රමාණය සභාව විසින් හඳුනාගෙන, සන්නිවේදන පහසුකම් සපයා ඇති සමාගම් අනුව වාර්ෂික වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.

**2.3.6 උසාවි දඩ මුද්දර ගාස්තු**

------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ රු.300,000 ක් ද, මුද්දර ගාස්තු රු.9,229,339 ක් විය.

## 03. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී රු.80,000 ක වියදම් දරා කුලී ආදායම් ගිණුම්ගත කිරීමට පරිගණක වැඩසටහනක් ක්‍රියාත්මක කර පැවතියද සභාවේ සහ විගණන අංශශාතාවයන්ට ප්‍රමාණවත් තොරතුරු ලබා ගැනීමට නොහැකිවී තිබුණු අතර එම වැඩසටහන් වැඩි දියුණු කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) නගර සභා සාප්පු සංකීර්ණයේ තුන්වන මහලේ වර්ග අඩි 630 ක් වූ අංක 64 කාමරයේ කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වා ගැනීම සඳහා 1999 දෙසැම්බර් 26 දින ශක්ති ප්‍රජා මණ්ඩලය වෙත මාසික කුලී පදනම මත බදු දී තිබූ අතර, ගිවිසුම් කොන්දේසි 02 ක පරිදි මාසික කුලිය සංශෝධනය නොකර වර්තමානය දක්වාම රු.3,300 ක ගාස්තුව පමණක් අයකර තිබුණි.

(ඇ) දේපල ණය ලබාගත් සේවකයින්ගේ ණය වාරිකයට අදාල රජයේ දායකත්වය අදාල සේවකයාගෙන් අවකරණය කිරීමට පෙර 2015 මාර්තු 09 දින සේවකයින් 04 දෙනෙකුගේ වර්ෂයකට අදාල රජයේ දායකත්ව වටිනාකම වූ රු.408,637 ක් හා 2015 ජූනි 24 දින එක් සේවකයකුගේ මාස 09 කට අදාල රු.36,391 ක්ද ගෙවා තිබුණි.

(ඈ) සභාව විසින් ලක්ෂ්මිපුර නිවාස යෝජනා ක්‍රමය අදියර 02 ක් යටතේ ක්‍රියාත්මක කර තිබූ අතර පළමු අදියර සඳහා රු.7,617,412 ක් වැය වූ බව දැක්වුවද, 2011 – 2012 ක්‍රියාත්මක වූ දෙවන අදියර අතර මග නතර කර තිබුණි. 2012 වර්ෂයේ සංගණනයකට අනුව නිවාස 61 න් 12 ක සභාවේ සේවය නොකරන පුද්ගලයන් පදිංචි වී තිබුණි. මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර හිමිකම් ලේඛණයක්ද නඩත්තු කර නොතිබුණි.

(ඉ) කහටගහමුල ඉඩම් කට්ටි සැලැස්ම අනුව කැබලි 09 ක් කොටස් කර තිබූ අතර ඉන් 05,06,07,08,09 කැබලි 05 ක් පමණක් නගර සභා බල ප්‍රදේශයට අයත් වූ බැවින් සියයට එකක (1%) බද්දට යටත්ව සැලැස්ම අනුමත කිරීමට 2015 මැයි 11 දින සැලසුම් කමිටුව නිර්දේශ කර තිබුණි. නගර සභා අඥාපනතේ 165 ඇ (1) වගන්තියේ විධිවිධාන අනුව කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි.

### 3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 සැප්තැම්බර් 10 දින රු.1,349,000 ක් ගෙවා පොලිතීන් බේල් කිරීම සඳහා යන්ත්‍රයක් මිලදී ගනු ලැබුවද අලෙවි කටයුතු විධිමත් පරිදි සැලසුම් නොකිරීම මත බේල් කරනු ලබන පොලිතීන් අලෙවිකර ආදායම් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) දෛනික ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය වෙත කසල ටොන් 09 ක් පමණ එකතු කරන අතර ඉන් ටොන් 07 ක් කොම්පෝස්ට් පොහොර සෑදීම සඳහා යොදාගෙන තිබුණි. ඉතිරි ටොන් 02 ක පොලිතීන් 2015 වර්ෂයේ මුල් අර්ධ වර්ෂයේ අලෙවි කර රු.9,590 ක් උපයාගෙන තිබුණද 2015 සැප්තැම්බර් සිට යන්ත්‍රය භාවිතා කර බේල් කරනු ලබන පොලිතීන් පුද්ගලික ආයතනයකට නොමිලේ බෙදාදීම හේතුවෙන් එම ආදායම අහිමි වී තිබුණි.

**04. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

**4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.2 වත්කම් කළමනාකරණය**

**4.2.1 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

පොදු වෙළඳපල අංක 02 හා 03 කඩ කාමර 2014 ජූලි 15 දින සිට 2015 ජූලි දක්වාම යෝජිත සංවර්ධන සැලැස්මක් නොමැති වීම හේතුවෙන් නිෂ්ක්‍රීයව තිබුණි.

**05 <u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) සන අපද්‍රව්‍ය කළමනාකරණය